**ඉරක්කාමම් ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**----------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**--------------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන2019 මාර්තු19 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමණාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ඉරක්කාමම් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**---------------------------------------------**

### (අ) ගිණුම්කරණ අඩුපාඩුව
**------------------------**

| **ගිණුම්කරණ අඩුපාඩු** | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------ | --------------------- |
| පළාත් පාලන අමාත්‍යාංශයෙන් රු. මිලියන 10 ක් පිරිවැයකින් ඉදිකර 2011 වර්ෂයේදී සභාවට භාරදෙන ලද කාර්යාල ගොඩනැගිල්ලේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | ගොඩනැගිලිවල වටිනාකම ගිණුම්ගත කල යුතු වේ. | ප්‍රාදේශීය සභා ගොඩනැගිලිවලට අදාල ලියවිලි අදාල අමාත්‍යාංශයෙන් ලබාගෙන අවසන් ගිණුම්වල දැක්වීමට කටයුතු කර ඇත. |

### (ආ) ලේඛනමය සාක්ෂි නොමැති වීම
**-----------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------ | ----------- | -------------- |
| ඉඩම් ඔප්පු , ස්ථාවර වත්කම් ලේඛනය හා ශේෂ සනාථන ඉදිරිපත් නොකිරීම නිසා රු. 4,505,898 ක් වටිනා ගිණුම් විෂයයන් 02 ක් විගණනයේදි සතුටු දායක ලෙස සත්‍යක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් ශේෂ සනාථ කිරීමේ සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ . | ස්ථාවර වත්කම් ලේඛනයේ ඉඩම් හා ගොඩනැගිලි සඳහන් කරමි. මෙය අදාල විස්තර ලේඛනමය සාක්ෂි සමන්තුරෙයි ප්‍රාදේශීය සභාවෙන් ලබා ගැනීමට කටයුතු කර ඇත. |

**1.4 අනුකූල නොවීම**

**------------------**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

**---------------------------------------------------------------------------**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | ---------------- | ----------------- | ------------ | ---------------- |
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති වගන්තිය 193 | අයවැය සමඟ අය සහ වැය විෂයයන් සසඳා අතිරික්ත හා ඌනතා වලට හේතු දැක්වෙන ප්‍රකාශනයක් සකස්කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදාල කාලය තුල ප්‍රකාශන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. | සභාවේ එක් එක් මුදල් වර්ෂය සඳහා ආදායම් සහ වියදම් පිළිබද විස්තර අයවැය සමඟ සසඳා තිබුණද, ඒ පිළිබද විස්තර ලැයිස්තුව ඉදිරියේදී විගණනයට ඉදිරිපත් කරන බව දන්වමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වසර දෙක ඉක්මවූ රු. 85,907 ක තැන්පත් 02 ක් සම්බන්ධයෙන් අදාල පුද්ගලයින්ට ආපසු ගෙවීමට හෝ ආදායමට ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත්වූ තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. | මෙම වසර ඇතුලත ඒ අය ආපසු ලබා නොගතහොත් 2019 වසර අවසානයේ ආදායමට මාරු කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**----------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම් ඉක්මවූ වියදම්රු.341,092ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් රු.2,156,203ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

------------------------

**2.2.1** **ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

-----------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම්හා බදු | 100,000 | 18,250 | 18,250 | - | 30,000 | 43,750 | 43,750 | - |
| කුලී | 1,980,000 | 920,650 | 1,018,450 | 1,034,023 | 4,075,400 | 3,743,335 | 3,684,000 | 1,131,823 |
| බලපත්‍රගාස්තු | 705,000 | 817,410 | 817,410 | - | 670,000 | 672,590 | 673,000 | - |
| වෙනත් ආදායම් | 6,021,000 | 3,930,944 | 3,930,944 | - | 2,258,000 | 1,990,592 | 1,990,592 | - |

### 2.2.2 මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ තිබෙන නිශ්චල දෙපල මාරුකිරීමේදි නැගෙනහිර පළාත් ආදායම් දෙපාර්තුමේන්තුවෙන් 2017 සහ 2018 වර්ෂවල සෘජුව සහ ජංගම සේවය මගින් අයකරගත් අතිරේක මුද්දර ගාස්තු ගණනය කර අයකරගෙන නොතිබුණි. | අත්හැරුනු හිඟ ප්‍රමාණයට අදාල මුද්දර ගාස්තු සඳහා ලියවිලි පිළියෙල කර අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු එවා නැත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධන යන සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කරීම් පිළිබඳව අනාවරණයවූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත් 126 වගන්තිය අනුව, ප්‍රාදේශීය සභාවේ ආදායම් සහ විධිමත් කිරීමට ප්‍රධාන කාර්යයන් 20 කට අදාලව අතුරු ව්‍යවස්ථා සකස්කර ක්‍රියාත්මක කළයුතුය. ප්‍රාදේශිය සභාව විසින් 2013 නොවැම්බර් 22 දින කරුණු 05 ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවලට අදාල යෝජනා නැගෙනහිර පළාත් පාලන ඇමතිතුමාගේ අනුමැතිය සඳහා යවා තිබුණද, 2018 දෙසැම්බර් 31 දින දක්වා අනුමැතිය ලබා ගෙන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතුවේ. | නීති අංශයේ ඉල්ලීම අනුව නැවත දැනට තිබෙන සභාවේ අනුමැතිය ලබා ගෙන සංශෝධනය සමඟ යවන ලද බව දන්වා සිටිමි. |

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සකස්කළ නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා අනුව ක්‍රියාත්මක කළයුතු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළයුතු වේ. | පිළිතුරු එවා නැත. |

(ඇ) පරිසර ගැටළු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ 2015 වර්ෂයේ රු. 1,338,328 ක පිරිවැයක් දරා ඉදිකර තිබූ ඝාතකාගාරය යාබදව සුසාන භූමියක් තිබීම සම්බන්ධයෙන් අවධායනය යොමු කිරීමකින් තොරව ඉදිකිරීම නිසා මහජන විරෝධතා හේතුවෙන් අද වනතුරු ප්‍රයෝජනයට ගැනීමට නොහැකිව තිබුණි. | අදාල අරමුණ සඳහා හෝ වෙනත් කටයුතු සඳහා ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | මහ ඇමතිතුමාගේ ලේකම්ගේ උපදෙස් අනුව මෙම ස්ථානය දැනට සණඅපද්‍රව්‍ය ප්‍රතිචක්‍රිය කිරීමේ ව්‍යාපෘතිය සඳහා යොදා ගැනීමට සැලැසුම් කර ඇති බව දැනුම් දෙමි. |

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත අනුව 2030 වර්ෂයේ එක්සත් ජාතීන්ගේ න්‍යාය පත්‍රයට අනුකූල වන පරිදි සෑම පොදු ආයතනයක්ම ක්‍රියා කළයුතුයි. කෙසේ වූවත්, මේ සම්බන්ධ ඉලක්ක හඳුනාගෙන ලඟා කරගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන එය ලඟාකර ගැනීමට කටයුතු කළ යුතු අතර, එය මැනීමට දර්ශක සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු එවා නැත. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභා කාර්යාලය, පුස්තකාල, පොල, මහජන ක්‍රීඩාංගනය සහ ඝාතකාගාරය යන ස්ථාන පිහිටුවා ඇති ඉඩම් ඔප්පු සභාව විසින් සභාවේ නමට මාරු කරගෙන නොතිබුණි. | ඉඩම් සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉඩම් ගොඩනැගිලි අයිතිය පවරා ගැනීම සම්බන්ධයෙන් දැනටමත් කටයුතු කර ඇති අතර, මෙම ඉඩම් වල ලියවිලි ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (ආ) | පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ සංවර්ධන අරමුදල් වැඩ සටහන් යටතේ රුපියල් මිලියන 4,690 වියදමින් 2018 වර්ෂයේ ඉදිකරන ලද වෙළඳ සංකීර්ණය 2019 මැයි 14 දින දක්වා බදු දීමට කටයුතු කර නොතිබුණි. | අදාල ගොඩනැගිලි බදු දීමට කටයුතු කළ යුතු වේ. | මාසික කුලිය තීරණය කිරීම සඳහා තක්සේරු කරන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවට යැවීමට කටයුතු සුදානම් කර ඇත. ඉන්පසු බදු දීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ඇ) | 2003 සිට 2010 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයේ හිඟව පැවති හිඟ මස් කඩ බදු කුලිය රු. 1,029,223 මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණද, එය අදාල ලියවිලි ලේඛන සහ සනාථ කිරීමට අවශ්‍ය සාක්ෂි කිසිවත් නොතිබුණද, හිඟ මුදල් අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට 2019 මැයි 14 දින දක්වා කටයුතු කර නොතිබුණි. | හිඟ අයකර ගැනීමට හෝ නිසි පරිදි කපා හැරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | දැනට මෙම මස්කඩ හිඟ බදු මුදල පිළිබඳ බදුකරුවන් සොයා ගැනීමට නොහැකිව ඇත. ඔවුන්ගේ පදිංචි ලිපිනය සොයාගැනීමට නොහැකි බැවින් අදාල මුදල කපා හැරීමට අනුමැතිය ලබා ගැනීමට කටයුතු යොදා ඇත. 2004 වර්ෂයට අදාල හිඟ මුදල් විලින් රු. 3,000 ක් පමණක් අයකරගත හැකි විය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ තනතුරු 5 ක පුරප්පාඩු සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පුරවා නොතිබුණි. තවද, 2014 වර්ෂයේ සිට පුරප්පාඩුවී තිබූ සභාවේ ආදායම් පරික්ෂක තනතුර සඳහා බඳවා නොගැනීමෙන් ආදායම් මාර්ග හඳුනාගැනීම සහ ආදායම් රැස්කිරීම යන ක්‍රියාවන් සාර්ථකව ඉටුකිරීමට නොහැකිවී ඇත. | සභාවේ තිබෙන පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කළ යුතු වේ. තවද,ආදායම් පරීක්ෂක තනතුරු සඳහා කඩිනමින් බඳවා ගැනීම් කර ආදායම් රැස්කිරීමට කටයුතු කළ යුතු වේ. | ආදායම් පරික්ෂක පුරප්පාඩු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානිට සහ අමාත්‍යාංශ ලේකම්ට කිහිප වතාවක් දැනුවත් කර ඇත. නමුත් මෙතෙක් පිරවීමට කටයුතු කර නැත. 2019 වර්ෂයේ මෙම පුරප්පාඩු පුරවන බව අමාත්‍යාංශ ලේකම් දැනුම් දී ඇති බව දන්වා සිටිමි. තවද, පළාත් පාලන කොමසාරිස්ට ලිඛිතව ඉල්ලා ඇත. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය අනුව ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ තිබෙන වෙළඳ සැල් 305 ක් සහ නිවාස 4,673 ක් සඳහා 2010 වර්ෂයේ සිට වරිපනම් බදු | සභා බලප්‍රදේශයේ දියුණු ප්‍රදේශ හඳුනාගෙන එම ප්‍රදේශවලින් වරිපනම් බදු | ඉරක්කාමම් ප්‍රාදේශීය සංවර්ධන නොවූ අඩු ආදායම් ලාභී දුගී ජනතාව වෙසන ප්‍රදේශයකි. මෙම ප්‍රදේශයේ වාසය කරන අයගේ ප්‍රධාන රැකියාව ගොවිතැන සහ මාළු ඇල්ලීම වේ. කෙසේවෙතත්, බදු |

| | | |
|---|---|---|
| තක්සේරුකර අයකර ගැනීමට කටයුතු කර නොතිබීමෙන් වාර්ෂිකව දළ වශයෙන් රු. 2,500,000 ක ආදායමක් අහිමි වේ. | අයකිරීමට කටයුතු කල යුතු වේ. | අයකිකරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට සභාපති විසින් සභාවේ යෝජනා ඉදිරිපත් කළද ආදායම් මට්ටමය සහ වාසය කරන ප්‍රදේශය හඳුනා ගැනීම ගැටළු නිසා සභාවේ අනුමැතිය නොලැබුණි. |

## 3.5 වත්කම් කළමනාකරණය

---------------------------

### 3.5.1 වත්කම් ලේඛන ගත නොකිරීම

--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම් රු.18,514,344 ක් ලෙස ගිණුම්වල දක්වා තිබුණද, ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කළ යුතු වේ. | ඔබ විසින් සඳහන් කරන ලද ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම රු. 18,514,344 ක් සභාව සමන්තුරේ ප්‍රාදේශීය සභාවේ උප කාර්යාලය වශයෙන් තිබී වෙනමම ප්‍රාදේශීය සභාවක් වශයෙන් වෙන්කළ අවස්ථාවේදි වත්කම් හා බැරකම් භාර දීමේදී අවසන් ගිණුම්වල පෙන්වා තිබුණද, ඒ සම්බන්ධ ලියවිලි කිසිවත් භාරදී නොතිබු අතර, ඒ සම්බන්ධ තොරතුරු කිසිවත් ඔවුන් සතුව නොමැති බැවින් අදාල වත්කම්, වත්කම් ලේඛනයේ ඇතුලත් කිරීමේදී අභියෝගයකට මුහුණු දීමට සිදුවි ඇත. |

### 3.5.2 <u>වත්කම් වල ආරක්ෂාව තහවුරු නොකිරීම</u>

----------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු වාහන 12 ක් මහජන පොල භූමියේ නිසි ආරක්ෂාවකින් තොරව ගාල් කර තිබුණි. | වාහන අංගන පහසුකම් ඇතිකිරීමට කටයුතු කළ යුතු වේ. | අප සභාවට අයත් වාහන ආරක්ෂා සහිතව නවතා තැබීමට වාහන අංගනය ඉදිකිරීමට දැනටමත් කටයුතු කළද, මුදල් නොමැතිවීම හේතුවෙන් 2019 වර්ෂයේ පළාත් නිශ්චිත අරමුදලින් ප්‍රතිපාදන ලබාගැනීම සඳහා දැනට යවා ඇති බව දන්වා සිටිමි. |

### 3.5.3 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු JCB යන්ත්‍ර 01 ක් සහ Motor Lorry 01 ක් මාස කිහිපයක සිට අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | වාහන අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | JCB වාහනය අළුත්වැඩියා කිරීම සඳහා බලයලත් ආයතනවන Awarns mart ආයතනයට දන්වන ලදි. මෙම ආයතනයෙන් Mechanical Engineer පැමිණ පරීක්ෂා කිරීමෙන් පසු මෙම අළුත්වැඩියාව අවශ්‍ය අමතර කොටස් චීනයෙන් ලබාගතයුතු බවද,චීනයේ මාසයක් නිවාඩු බැවින් මාස දෙකක කල් ඉල්ලා ඇත. මේ අනුව මේ වාහන සහ අනෙකුත් වාහන අළුත්වැඩියාකර ධාවනයේ යෙදවීමට ක්‍රියා කරනු ලැබේ. |

### 3.5.4 නිෂ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | UNDP වැඩසටහන් යටතේ රු. මිලියන 4.975 ක් වියදමින් 2017 වර්ෂයේ ඉදිකරන ලද මහජන පොල ගොඩනැගිල්ලේ උඩු මහල 2019 මැයි 14 දක්වා ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව තිබුණි. | මහජන පොල ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | ගොඩනැගිල්ලේ උඩු මහල අවුරුදු උත්සව අවස්ථාවල සති පොල පැවැත් වීම සඳහා සහ පොදු උත්සව සඳහා ප්‍රයෝජනයට ගනු ලබන බව දැනුම් දෙමි. |
| (ආ) | පළාත් නිශ්චිත සංවර්ධන ආධාර වැඩ සටහන යටතේ 2016 වර්ෂයේදි මිලදි ගෙන තිබු රු. 325,000 ක් වටිනා අපද්‍රව්‍ය ඇඹරීමේ යන්ත්‍රය 2019 මැයි 14 දිනය දක්වා සභාව විසින් අදාල ස්ථානයේ සවිකිරීමකින් තොරව නිෂ්කාර්යව පැවතුනි. | අදාල අපද්‍රව්‍ය අඹරන යන්ත්‍රය සවිකර ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු වේ. | එම යන්ත්‍රය සවිකිරීමේදි, එය නඩත්තු කිරීමේදි , ඒ සඳහා යන අතිරේක වියදම් සහ ආරක්ෂක අවශ්‍යතා යන හේතුන් මත සවිකිරීමකින් තොරව ඇත. |

### 3.5.5 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ මුදල් ප්‍රතිපාදන යටතේ වරිපත්තාන් හේන සෞඛ්‍ය මධ්‍යස්ථාන මාර්ග කොන්ක්‍රීට් දමා සකස් කිරීමේ කර්මාන්තය රු. මිලියන 1.73 ක් වියදමින් ඉටුකර තිබුණි. 166 m දිග කොන්ක්‍රීට් මාර්ගයට අදාල ඇස්තමේන්තුව කොන්ක්‍රීට් දැමීමේ මූලික වැඩ කොටස් වන Shutteringසහ Road Levelling යන අයිතමයන් නොමැතිව සකස්කර තිබුණි. | ඇස්තමේන්තු සකස් කිරීමේදී අදාල නිර්මාණයේ ප්‍රධාන වැඩ කොටස් සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇස්තමේන්තුව සකස්කළ යුතු වේ. | අදාල මාර්ගයේ ඇස්තමේන්තුව පිළියෙල කිරීමේදි Shuttering, Road Levelling වැරදීමකින් මගහැරී ඇත. කර්මාන්තය ඉටුකිරීමේදි කොන්ත්‍රාත්කරු සමඟ සම්බන්ධවී නිමකරන ලද බව දන්වා සිටිමි. |

**4 ගිණුම් ගතයුතුභාවය සහ යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදි සභාව අභ්‍යන්තර විගණන කටයුතු සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණන කටයුතු සිදුකළ යුතු වේ. | පිළිතුරු එවා නැත. |